තල් සංවර්ධන මණ්ඩලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තල් සංවර්ධන මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය දරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය කටයුතු කර ඇති බව, සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 71 වන ඡේදයට අනුව, වත්කමක ප්‍රයෝජනවත් ආයු කාලය අර්ථ දක්වා ඇත්තේ එම වත්කමෙන් ආයතනයට අපේක්ෂිත උපයෝගීතාව අනුවය. ගොඩනැගිලි සඳහා, ආයතන සාමාන්‍යයෙන් අවුරුදු 15 සිට 25 දක්වා ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇස්තමේන්තු කරයි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ගොඩනැගිල්ල වසර 10 ක් සඳහා ක්ෂය කර ඇති අතර, එමගින් එහි සත්‍ය භාවිතය නිවැරදිව පිළිබිඹු නොවිය හැකිය. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.10,985,784ක් අඩුවෙන් දක්වා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.10,985,784ක සමුච්චිත ක්ෂයවීම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 71 වන ඡේදයට අනුව, වසර 15 සිට 25 දක්වා කාලයක් තුළ ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණනය ගැලපීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය පියවර ගනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS) අංක 07 සමඟ අනුකූල විය යුතුය.

(ii)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS) අංක 07හි 65වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත්, එසේ කටයුතු නොකළ බැවින්, රු.55,798,368 ක වටිනාකමින් යුත් ගොඩනැගිලි සහ වාහන සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තවමත් භාවිතයේ පැවතුනි. එබැවින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 03 හි පරිදි මෙම ඇස්තමේන්තුගත දෝෂය සංශෝධනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. තවද, මණ්ඩලයේ දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති අතර, ඉහත ප්‍රමිතීන් මඟින් අපේක්ෂිත ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය තුළින් වත්කම්වල සැබෑ ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබිඹු නොකරන බව එයින් අදහස් වේ.	මූල්‍ය වාර්තාව සකස් කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 07හි 65 ඡේදයට අනුකූලව කළමනාකාරිත්වය විසින් ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS) අංක 07 සමඟ අනුකූල විය යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කලමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව වාහනවල ප්‍රයෝජනවත් ආයු කාලය වසර 05 ක් ලෙස දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ කාර්යාල වාහන 02ක් සහ බෙදාහැරීමේ වාහන 02ක් සඳහා ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය අවසන් වීමෙන් පසුව පවා ක්ෂයවීම් වෙන් කර තිබුණි. ඒ හේතුවෙන්, මෙහෙයුම් කටයුතුවලින් ලද ලාභය රු.862,487කින් අඩුවෙන් දක්වා තිබුණි.	ක්ෂයවීම් ගණනය කර අගය ශුන්‍යයට අඩු කරන ලදී. කෙසේ වෙතත්, කළමනාකාරිත්වය විසින් ලබන වසරේ සිට කාර්යාල සහ බෙදාහැරීමේ වාහන ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.	වත්කම්වල නිවැරදි වටිනාකම දැක්වීමට පියවර ගත යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කලමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුළ ලංකා බැංකු ගිණුම හරහා සිදු කරන ලද රු.9,159,469 ක ගෙවීම් සඳහා ගෙවීම් වවුචර් මෙම වාර්තාවේ දිනය වන තෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ජර්මානු ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය වන Deutsche Gesellschaft fur Internationale Zusammenarbeit (GIZ) යටතේ මෙම මුදල ගෙවන ලදී. කළමනාකාරිත්වය විසින් සංවිධානයෙන් වවුචරය ඉල්ලා ඇත. වවුචරය ලැබුණු පසු, එය වැඩිදුර	වාර්තා පවත්වා ගැනීම ශක්තිමත් කිරීම සහ විගණනය සඳහා වවුචර් තබා ගැනීම සහතික කිරීම.

සලකා බැලීම සඳහා ජාතික විගණන කාර්යාලයට යොමු කරනු ලැබේ.

1.6 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ සමඟ අනුකූල නොවීම

	නීති,රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
1.6.1	1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනතේ 46 වගන්තිය සහ 16 උපවගන්තිය	පනතේ විධිවිධාන අනුව, නියමිත දිනට දායක මුදල් ගෙවීමට අසමත් වීමෙන් මණ්ඩලය තවදුරටත් රු.389,069 ක මුළු දණ්ඩනයක් ගෙවීමට බැඳී සිටින බව නිරීක්ෂණය කරන ලදී.	සේවක භාර අරමුදලේ අධිභාරය පියවීමට කටයුතු කරනු ලැබේ.	සේවක භාර අරමුදල් පනත යටතේ නියමිත කාලසීමාව තුළ දායක මුදල් ගෙවිය යුතු අතර, ප්‍රමාදයන්ට වගකිව යුතු පාර්ශවයට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.
1.6.2	1981 අංක 26 දරන සේවක අර්ථසාධන අරමුදල් පනතේ 16 වගන්තිය	පනතේ විධිවිධාන අනුව, 2001 සිට 2021 කාල පරිච්ඡේදයට අදාළව නියමිත දිනට දායක මුදල් ගෙවීමට අසමත් වීමෙන් මණ්ඩලය තවදුරටත් රු.41,966,393 ක මුළු දණ්ඩනයක් ගෙවීමට බැඳී සිටින බව නිරීක්ෂණය කරන ලදී.	ඔවුන්ගේ අරමුදල් වෙන්කිරීමේදී මුළු සේවා නියුක්ති මුදල මත අධිභාරය සළකා බැලීමට සහ එය මණ්ඩලයට නිදහස් කරන ලෙස අමාත්‍යාංශයට ඉල්ලීමක් යවා ඇත. විය හැකි අතහැරීමක් සඳහා මෙම කරුණ කම්කරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.	සේවක භාර අරමුදල් පනත යටතේ නියමිත කාලසීමාව තුළ දායක මුදල් ගෙවිය යුතු අතර, ප්‍රමාදයන්ට වගකිව යුතු පාර්ශවයට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.
1.6.3	මූල්‍ය සහ ආර්ථික ස්ථායීකරණ අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛහි 01/2024 හි 11.4 වගන්තිය	අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2024 නොවැම්බර් මාසයේ දී නිල වාහනයට අමතරව NPJT 6864 දරන වාහනය භාවිතා කිරීම සඳහා මණ්ඩලයේ සභාපති වෙත රු.38,993 ක් වටිනා අමතර ඉන්ධන ලීටර් 120 ක් ලබා දී තිබුණි.	WPKB 8037 නිල වාහනය අක්‍රීය තත්ත්වයට පත් වූ දා සිට NPJT 6864 දරන වාහනය පෙර සිටි සභාපති විසින් භාවිතා කරන බව දක්වා ඇත. රු.38,993 ක් වටිනා ඉහත අමතර ඉන්ධන ප්‍රමාණය සඳහා අනුමැතිය කෘෂිකර්මය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් යවා ඇත.	අදාළ චක්‍රලේඛයට අනුගතව ක්‍රියා කළ යුතු අතර, ඊට අනුගත නොවූ පාර්ශවයට එරෙහිව විධිමත් පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ දී මෙහෙයුම් ප්‍රතිඵලය රු.40,077,395 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව, ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,954,968 කි. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,122,427 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම සහ වෙනත් ඉපැයීම්වල අඩුවීම හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාවයන්

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ දැනට පවතින බදු ගිවිසුම දීර්ඝ කරන ලද අතර, නිසි තක්සේරුවක් සහ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු නොකර සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව 2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 වගන්තියට පටහැනිව 2022 ඔක්තෝම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා බදු මුදල් ලෙස රු.13,000,000 ක් ගෙවන ලදී.	කොළඹ පිහිටි නගර කාර්යාලය බොහෝ කාලයක සිට මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරයි. 2020 සිට 2024 දක්වා පෙර සිටි සභාපති මෙම ස්ථානයේ සිට සියලු කළමනාකරණ කටයුතු සිදු කර ඇත. මෙම කාලසීමාව තුළ, නගර කාර්යාල කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන්ම කාර්යයෙහි නිරත වූ අතර උසස් මට්ටමේ ඵලදායීත්වයක් පවත්වා ඇත. විශේෂයෙන්ම, 2020-2024 කාලසීමාව තුළ රජයට මූල්‍ය අලාභයක් සිදු කර නොමැත.	බදු ගිවිසුම අදාළ චක්‍රලේඛය සමඟ අනුගත විය යුතු අතර, වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2012 සිට 2024 වර්ෂය දක්වා කාලසීමාව තුළ තල් පර්යේෂණ මධ්‍යස්ථානයේ විද්‍යාගාරයේ තිබූ රු.7,079,928 වටිනා රසායනික ද්‍රව්‍ය වර්ග 762 ක් කල් ඉකුත් වූ බව නිරීක්ෂණය කරන ලදී. සත්‍ය අවශ්‍යතාවය තක්සේරු කිරීමකින් තොරව රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම නිසා මෙම අලාභය සිදුව ඇත.	රසායනික ද්‍රව්‍ය ඒවායේ කල් ඉකුත්වීමේ දින පසුව තිබුණත්, ඒවායේ ක්‍රියාකාරිත්වය විශාල වශයෙන් ස්ථාවරව පැවතීමෙන් බොහෝ ද්‍රව්‍ය දිනපතා විද්‍යාගාර පර්යේෂණ සඳහා නොකඩවා භාවිතා කරන ලදී. ISO 17025 ආශ්‍රිත කටයුතු වැනි ඉහළ සංවේදී ක්‍රියාකාරකම්වලට මෙම කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය භාවිතා නොකරන අතර ඒවායේ භාවිතය පර්යේෂණ ප්‍රතිඵලවල ගුණත්වය කෙරෙහි බල නොපායි.	මනා තොග පාලන පද්ධතියක් පවත්වා ගැනීමට සහ කල් ඉකුත් වූ අයිතම පොත් වලින් ඉවත් කර තැබීමට පියවර ගත යුතුය. වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වේ.

		සමහර රසායනික ද්‍රව්‍ය කල් ඉකුත්වීම ඇතම් නොවැළැක්විය හේතුන් නිසා සිදු විය.	
(ඇ)	2016,2021,2022 සහ 2023 වර්ෂ සඳහා ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු මුළු විගණන ගාස්තුව වූ රු.4,361,760 ක් 2025 සැප්තැම්බර් 19 දින දක්වා පියවීමකින් තොරව පවතී.	වසංගත තත්ත්වය හේතුවෙන් වූ මූල්‍ය අර්බුදය, පහළ විකිණුම් සහ අතිරේක මූල්‍යනය නොමැති වීම නිසා, මණ්ඩලය ගෙවීම් වාරික වශයෙන් සිදු කිරීමට තීරණය කරන ලදී.	විගණන ගාස්තු ගෙවීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති රු.62,525,897 ක් වටිනා ඉඩම් 14 ක හිමිකාරීත්වය පවරා ගැනීමට මණ්ඩලය කටයුතු කර නොමැත.	ඉඩම් හිමිකාරීත්වය පවරා දීමට කළමණාකරණය පියවර ගනිමින් සිටී.	ඉඩම්වල හිමිකාරිත්වය මණ්ඩලයට පවරා ගැනීමට පියවර ගත යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්වන ලද රු.9,270,000 ක ධාරණ අගයක් සහිත වාහන දාහතරක (14) හිමිකාරීත්වය පවරා දීමට මණ්ඩලය කටයුතු කර නොමැත.	වාහන හිමිකාරීත්වය පවරා දීමට කළමණාකරණය පියවර ගනිමින් සිටී.	වාහනවල හිමිකාරිත්වය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 නිෂ්ක්‍රීය සහ ඌනඋපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	තල් සංවර්ධන මණ්ඩලයේ ද්‍රව සහ පිටි ඇසිරීම සහ හකුරු සැකසීම සඳහා නිෂ්පාදන මධ්‍යස්ථාන වෙනුවෙන් 2014 සහ 2018 වර්ෂ වලදී මිලට ගත් යන්ත්‍රෝපකරණ හතරේ වටිනාකම රු.15,900,000 කි. කෙසේනමුත්, මණ්ඩලය මෙම යන්ත්‍රෝපකරණ උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබූ අතර, වර්ෂ 05 ක් පුරා නිශ්ක්‍රියව පවතී.	සක්‍රිය ලෙස තල් නිෂ්පාදන ප්‍රවර්ධනය කරන සමිතිවලට යන්ත්‍රෝපකරණ පරිත්‍යාග කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. අමතරව, NERD වාර්තාව පදනම්ව යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට දැනටමත් කටයුතු කර ඇත.	වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් පසු,ඵලදායි ලෙස භාවිතා කල හැකි ආයතනයකට පැවරීමට කටයුතු කල යුතුය.

3.3 වාහන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	තල් සංවර්ධන මණ්ඩලයට අයත් වාහන නවයක් භාවිතයෙන් තොරව වර්ෂ 01 සිට වර්ෂ 10 ක කාලසීමාවක් දිරා ගිය තත්වයේ පවතින අතර, අලුත්වැඩියා කටයුතු සිදු කර නොතිබිණි. තවද, මෙම වාහන අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමෙන්තුවේ චක්‍රලේඛ අනුව, වෙන්දේසි කර ඉවත් කිරීමට පියවර ගෙන ඇත.	විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් පසු,දිරාගිය තත්ත්වයේ වාහන අපහරණය කිරීමට පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේනමුත්, 2024 වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන දින 174 ක ප්‍රමාදයක් සහිතව 2024 අගෝස්තු 21 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.	අධ්‍යක්ෂක මණ්ඩලය විසිරුවා හැරීම සහ නව සාමාජිකයින් පත් කිරීම ප්‍රමාදවීම නිසා AMC රැස්වීම පැවැත්වීමට නොහැකි විය. ඒ අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා නියමිත අනුමැතිය ලබා ගැනීම නොහැකිවීමෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් විය.කළමණාකරණය මෙම ප්‍රමාදය සඳහා වගකීම පිළිගන්නා අතර අනාගතයේ දී එය නියමිත කාලයට ඉදිරිපත් කිරීමට වගබලා ගනියි.	රාජ්‍ය ව්‍යාපාර සඳහා මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

4.2 වාර්ෂික වාර්තාව

	විගණන නිරීක්ෂණය	කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2025 නොවැම්බර් 30 දින වන තුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, මණ්ඩලයේ 2021,2022 සහ 2023 වර්ෂය සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ වෙත ඉදිරිපත් කර නොමැත.	2021 සහ 2022 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා අමාත්‍යාංශය අනුමත කර ඇති අතර, රේඛිය අමාත්‍යාංශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. 2023 වාර්තාව අමාත්‍යාංශය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	වාර්තා නියමිත කාලයට ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.